# CINEMATOGRAPHY FOR BEGINNERS

## FREE CHAPTER

### Cinema Quality Shots ගන්න අත්‍යවශ්‍ය Spacing රහස



**TRAINER: KANISHKA JAYASEKARA**

# Picture Composition

**Cinematography**වලදී වෘත්තීය **Cinematographer** කෙනෙකු ලෙස **Picture Composition** ගැන ඔබ දැන සිටිය යුතුය. එනම් ඔබේ **subject** එක **frame** එක තුළ ස්ථානගත කරන්නේ කෙසේද කියා ඔබ දැන සිටිය යුතු වේ.

මෙහිදී භාවිත වන මූලධර්ම කීපයක් ඇත. නමුත් සමහර අවස්ථාවල සිනමාපටයේ රූප රාමුවලින් ඉස්මතු වන හැඟීම් ප්‍රේක්ෂකයාට හොඳින් දැනෙන්නට සැලැස්වීම සඳහා මෙම මූලධර්මවලට පිටින් යමින් කටයුතු කිරීමට සිදු වන අවස්ථා ද ඇත. එයට ප්‍රධානම හේතුව සිද්ධාන්ත මත පමණක් පදනම්ව සමහර රූප රාමු සැකසීමට වඩා කලාත්මක බව ඉස්මතු විය යුතු අවස්ථා හඳුනාගෙන කලාත්මක බවක් රූප රාමුවලට ලබා දීමයි.

## Picture Composition හි ප්‍රධාන මූලධර්ම

### 1. Headroom

ඔබේ **subject** එකේ හිස මුදුන සහ **frame** එකේ ඉහළ කෙළවර අතර ඇති හිස්තැනෙහි ප්‍රමාණය Headroom ලෙස හැඳින්වේ. නිවැරදි headroom එකක් තිබීම සමතුලිත සහ ආකර්ෂණීය බවක් ගෙන දේ. Headroom එකෙහි ප්‍රමාණය ඉතා අඩු නම් subject එක හිරවී ඇති බවක් පෙන්වයි.




කෙසේ නමුත් **Picture Composition** යනු සිද්ධාන්ත **(Theory)** මත පමණක් පදනම්ව කළ හැකි දෙයක් නොවන නිසා සමහර අවස්ථාවල කලාත්මක බව **(Artistic)** ඉස්මතු කිරීම සඳහා **Headroom** සම්බන්ධ මූලධර්මය කඩ කිරීමට සිදු විය හැක. උදාහරණයක් ලෙස පුද්ගලයෙකු යම් ප්‍රශ්නයකින් දැඩිව පීඩා විඳින, සිරවී ඇති අවස්ථාවක් නිරූපණය කරන දර්ශනයක එම හැඟීම ප්‍රේක්ෂකයාට ලබා දීම සඳහා **Headroom** ඉතා අවම වන ලෙස තැබිය හැක. නමුත් ඒ සම්බන්ධ හොඳ අවබෝධයක් ඇතුව එය සිදු කළ යුතු වේ.

## 2. Nose Room (Lead Room)

පුද්ගලයෙකුගේ නාසයේ සිට **frame** එක අවසන් වන ස්ථානයට ඇති දුර මෙලෙස හැඳින්වේ. එනම් එම පුද්ගලයා බලා සිටින දිශාවට ඔහුගේ හෝ ඇයගේ මුහුණේ සිට ඇති දුර ප්‍රමාණය මෙහිදී අදහස් වේ. නිවැරදි **nose room** එකක් **frame** එකට ස්වභාවික බවක් එක් කරයි. එමගින් ප්‍රේක්ෂකයාගේ අවධානය රූප රාමුවේ සිටින පුද්ගලයා බලන දිශාවට යොමු කරනු ලැබේ.



## 3. Rule of Third

තිරස් රේඛා සහ සිරස් රේඛා භාවිත කරමින් frame එක සමාන කොටස්වලට බෙදිය හැකි බව ඔබේ ජංගම දුරකතනය භාවිතයෙන් ඡායාරූප ගැනීමේදී හෝ වීඩියෝපට ගැනීමේදී ඔබ දැක ඇති. මෙම රේඛා එකිනෙක ඡේදනය වන ලක්ෂ්‍යයන් (points) අතර ඔබේ frame එකේ වැදගත්ම අංගයන්, එනම් subject එකේ ඇස් හෝ ප්‍රධාන object එකක් ස්ථානගත කළ යුතුය.

එයට හේතුව වන්නේ, සාමාන්‍යයෙන් ප්‍රේක්ෂකයෙකුගේ ඇහැ එම රේඛා ඡේදනය වන ලක්ෂ්‍යයන් හතරට ප්‍රධාන වශයෙන් යොමු වීමයි. පහත රූපසටහන්වල වස්තූන් සහ පුද්ගලයන්ගේ ඇස්, ශරීරයේ වෙනත් කොටස් ස්ථානගත කර ඇති ආකාරය විමසිල්ලෙන් බැලූ විට ඔබට එය තේරුම් ගත හැක.





## 4. Leading Lines

සිනමා රූප රාමුවක subject එකක් හෝ ප්‍රධාන අංගයක් වෙත ප්‍රේක්ෂකයාගේ ඇස යොමු කිරීමට Leading Lines වැදගත් වේ.



මෙම රූප රාමුවේ ප්‍රේක්ෂක අවධානය යොමු විය යුතු පුද්ගලයා දෙස ඇස යොමු වන ආකාරයට ඔහු ස්ථානගත කර ඇත.



මෙම රූප රාමුවේ ප්‍රේක්ෂක ඇස යොමු විය යුතු පුද්ගලයා සිටින්නේ රූප රාමුවේ මැද කොටසේ වන අතර Leading Lines භාවිතයෙන් එය පෙන්වා ඇත්තේ මෙසේය.